කොළඹ රථවාහන කොට්ඨාසය
පොලිස් අධිකාරි රථවාහන කොළඹ කාර්යාලය
අංක 03, මිහිඳු මාවත, කොළඹ 12

දුරකතන අංක
தொலைபேசி எண்
Telephone Number
011-2431504

கொழும்பு போக்குவரத்து பிரிவு
இல. 03 மிஹிந்து மாவத்தைஇ கொழும்பு 12

ෆැක්ස්
தொலைநகல்
Fax Number
011-2326006

Colombo Traffic Division
NO. 03 Mihindu Mawatha, Colombo 12

ඊ-මේල්
மின்னஞ்சல்
Email
dir.citytraffic@police.lk


මගේ අංක
VdJ ,y.
My No.
T01/744/2025

ඔබේ අංකය
ckJ ,y;.
Your No.

දිනය
தேதி
Date
2025.01.27

---

නියෝජ්‍ය පොලිස්පතිතුමා,
රථවාහන පාලනය සහ මාර්ග ආරක්ෂාව දිසාව,
බස්නාහිර පළාත රථවාහන දිසාව (වැ/බලන).

**77 වන ජාතික නිදහස් සමරු උත්සවයේ විශේෂ රථවාහන රාජකාරි සම්බන්ධව සහ ඊට සමගාමීව 2025.01.29, 2025.01.30 , 2025.01.31 , 2025.02.01. 2025.02.02 වන දින පැවැත්වෙන පෙරහුරු රාජකාරි සම්බන්ධයෙන් මාධ්‍ය මගින් දැණුවත් කිරීම.**

2025.02.04 වන දින පැවැත්වෙන 77 වන ජාතික නිදහස් දිනය වෙනුවෙන් නිදහස් චතුරශ්‍රය කේන්ද්‍ර කර ගනිමින් පවත්වනු ලබන නිදහස් සමරු උත්සවය සඳහා කොළඹ රථවාහන කොට්ඨාසය මගින් විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

එම විශේෂ රාජකාරියට අදාලව පහත දිනයන් හි පෙරහුරු රාජකාරි පැවැත්වෙන බැවින් , කොළඹ රථවාහන කොට්ඨාසය මගින් ක්‍රියාත්මක කරනු ලබන රථවාහන සැලැස්ම සම්බන්ධයෙන් මාධ්‍ය මගින් දැණුවත් කිරීම සුදුසු බවට නිර්දේශ කරමි.

**පෙරහුරු රාජකාරි පැවැත්වෙන දිනයන් සහ වේලාවන්.**

2025.01.29 පැය 0600 සිට පැය 1200 දක්වා

2025.01.30 පැය 0600 සිට පැය 1200 දක්වා

2025.01.31 පැය 0600 සිට පැය 1200 දක්වා

2025.02.01. පැය 0600 සිට පැය 1200 දක්වා

2025.02.02. පැය 0600 සිට පැය 1200 දක්වා

- මෙම විශේෂ රථවාහන සැලැස්මට අදාලව තාවකාලිව සඳහන් දිනයන් හි වසා තැබෙන මාර්ගයන්
- **කුරුඳුවත්ත විජේරාම මාවතින් විද්‍යා මාවත දෙසට ඇතුල්වීම.**
- **කුරුඳුවත්ත බෞද්ධාලෝක මාවතින් මේටිලන්ඩ් පෙදෙසට ඇතුල්වීම.**
- **කුරුඳුවත්ත බෞද්ධාලෝක මාවතින් ප්‍රේම කීර්ති ද අල්විස් මාවත දෙසට ඇතුල්වීම.**
- **කුරුඳුවත්ත ස්ටැන්ලි විජේසුන්දර මාවතින් පදනම් ආයතන පාර දෙසට ඇතුල්වීම.**
- **කුරුඳුවත්ත නිදහස් වටරවුමෙන් නිදහස් චතුරශ්‍රය දෙසට ඇතුල්වීම.**

- **කුරුදුවත්ත හෝර්ටන් පෙදෙස මේට්ලන්ට් ක්‍රසන්ට් හංදියෙන් නිදහස් වටරවුම දෙසට ඇතුල්වීම.**
- **කුරුදුවත්ත ආර්.ජී.සේනානායක මාවතින් මේට්ලන්ඩ් ක්‍රසන්ට් ඔස්සේ නිදහස් වටරවුම දෙසට ඇතුල්වීම.**
- **කුරුදුවත්ත නිදහස් වටරවුම දෙසින් මේට්ලන්ට් ක්‍රසන්ට් දෙසට ඇතුල්වීම.**

මෙම මාර්ගයන් පෙරහුරු  පැවැත්වෙන කාල සීමාව තුලදී වසා තැබෙන අතර. අවස්ථානුකූලව එම ප්‍රදේශයේ පවතින  රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතවලට පැමිණෙන වාහන සඳහා පෙරහුරු රාජකාරියට බාධාවක් නොවන පරිදි ගමන් කිරිමට ඉඩ සලසා  දිමට කටයුතු කරනු ලබේ.

ඉහත සඳහන් රථවාහන සැලැස්ම සම්බන්ධයෙන් මාධ්‍ය මගින් දැණුවත් කිරිමට අවශ්‍ය කටයුතු සලසා දෙනමෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

එල්.පි.වර්ණකුලසූරිය,
පොලිස් අධිකාරි,
අධ්‍යක්ෂ (වැ/බලන),
කොළඹ රථවාහන කොට්ඨාශය.

එල්.පී.වර්ණකුලසූරිය
පොලිස් අධිකාරි
අධ්‍යක්ෂ (වැ/බ)
කොළඹ රථවාහන කොට්ඨාසය

පිටපත - 1.පි.ජී.නිශාන්ත මහතා , අතිරේක ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -දැ.ස.
2. ගොණුවට